කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2019 (පුනරීක්ෂණ)

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය -I

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: හතයි (07)

ප්‍රශ්න පත්‍රයේ ඇති පිටු සංඛ්‍යාව: හතරයි (04)

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> (04) <u>පමණක්</u> පිළිතුරු සපයන්න.

**(විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)**

---

01. නූතන ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවන්ගේ සුජාතභාවය පරීක්ෂාවට ලක්කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයෙහි මූලධර්මයන් විෂයෙහි හරයාත්මකව හා කාර්ය පටිපාටිකමය ලෙස ඒවායෙහි අනුගතවීමේ ප්‍රමාණය ඇසුරිනි.

    ඔබ එකඟවන්නේහිද? ඔබ කැමතියි වෙනත් රටවල් ද්විත්වයකින් උදාහරණ සපයමින් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 25)

02. නීතියේ ආධිපත්‍ය (Rule of Law) පිළිබඳ පොදු අවබෝධය වන්නේ ආණ්ඩුව නීතියට යටත් වන අතර පාලකයා නීතියට ඉහළින් නොසිටී යන්නයි. කෙසේ වුවද මෙහි 'ආධිපත්‍ය' (Rule) යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න නෛතික නොවන ප්‍රතිපත්තීන් ද යොදා ගනිමින් අර්ථය නිරූපණයට ලක්වීමට විවෘතව පවතී.

    නීති විශාරදයින්ගේ සහ අධිකරණයේ දායකත්වය ඇසුරින් නීතියේ ආධිපත්‍ය නැමැති සංකල්පය කාලාන්තරයක් පුරා විකාශනය වී ඇති ආකාරය සාකච්ඡා කරන්න. ඔබ කැමති ඕනෑම නීති ක්ෂේත්‍රයන් දෙකක අධිකරණ තීරණ ඔබට තෝරාගත හැකිය. (ලකුණු 25)

03. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක, පාලන අධිකාරියේ පැවැත්ම ජනතා කැමැත්ත මත පදනම් වී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ ජනතා පරමාධිපත්‍ය සුරක්ෂණය කර තිබෙන්නේ බලතල බෙදීමේ න්‍යාය අදාළ කරගැනීම හරහාය. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ බලතල බෙදීමේ න්‍යායට පටහැනි විවිධ ප්‍ර ප්‍රතිපාදන ඇතුළත් වී තිබෙන අතර, එනයින් ජනතා පරමාධිපත්‍ය යටපත් කර ඇත.

ආණ්ඩුක්‍රමව්‍යවස්ථා ප්‍රතිපාදන සහ නඩු තීරණ ඇසුරින් උදාහරණ සපයමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය පිළිබඳව අදහස් දක්වන්න. (ලකුණු 25)

04. යටත්විජිත සම්ප්‍රදායයන්, පශ්චාත්-ස්වාධීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සංකල්පය රඳවා තබා ගැනීමට ශ්‍රී ලංකාවට බලපෑම් කර තිබේ. කෙසේ වුවද ' සෝල්බරි' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සැසඳීමේදී 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි උත්තරීතරත්වය පිළිබඳ සාරයන් අර්ධ වශයෙන් ඇතුළත් කරගෙන තිබේ.

ඔබ එකඟවන්නේහිද? අදාල අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 25)

05. සරත්, සිලෝනිකා හි රාජ්‍ය සංස්ථාවක ඉන්ජිනේරුවරයෙකි. පසුගිය වසරේ, එම සංස්ථාවේ සේවකයින් විසින් පිහිටුවා ගනු ලැබූ වෘත්තීය සමිතියේ සභාපති වරයා වශයෙන් ඔහු තේරී පත්විය. සති දෙකකට පෙර, ' කොවිඩ්-19 අතරතුර සේවකයාගේ යහපත' පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂකවරු සමඟ සාකච්ඡා කිරීමට සරත් තීරණය කරනු ලැබුවේ, සංස්ථාව තුළ සෞඛ්‍යය හා ආරක්ෂණ පරිචයන් ඉහළ නැංවීම පිණිසය. පසුගිය සතියේ දී, ඔහු වෘත්තීය සමිතියේ සභාපතිවරයා වශයෙන්, අධ්‍යක්ෂකවරුන් වෙත හමුවීම සඳහා වේලාවක් ඉල්ලා නිල ඉල්ලීමක් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය, එකී වෘත්තීය සමිතියත්, එකී

වෘත්තිය සමිතියක් යැයි කියාගන්නා සංගමයේ සරත්ගේ සභාපතිත්වය පිළිනොගන්නා බවත් පවසමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙයට හේතුව එක්තරා අධ්‍යක්ෂකවරයකුගේ දේශපාලන බලපෑම් බව සරත් සොයාගන්නා ලදී. වෘත්තීය සමිතියෙ නිලධාරි මණ්ඩලය රාජ්‍ය සෞඛ්‍ය අධිකාරීන් විසින් නිකුත් කරන ලද කොවිඩ්-19 මාර්ගෝපදේශනය ට අනුගත වෙමින්, සංස්ථාව තුළ නිහඬ විරෝධතාවයක් සංවිධානය කිරීමට තීරණය කරන ලදී. විරෝධතා දිනයයේ දී, අධ්‍යක්ෂක මණ්ඩලය සෙලෝනිකා හි පොලිසියට මේ පිළිබඳව දැනුම්දෙන ලදී. පොලිසිය සාමකාමීව විසිරයන ලෙස විරෝධතාකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. පසුදින, සරත් සහ විරෝධතාවයට සහභාගී වූ ඔහුගේ සගයන්ට සේවා අවසන් කිරීමේ ලිපි ලැබිණි. එම ලිපි තුළ සේවය අවසන් කිරීමේ හේතුව වශයෙන්, ඔවුන් විරෝධතාවයට සහභාගී වීමත් ඒ තුළින් සංස්ථාවේ සෙසු සේවකයන්ට අනාරක්ෂිත සේවා පරිසරයක් නිර්මාණය කිරීමත් දක්වා තිබිණි.

සංස්ථාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ඔහුගේ ව්‍යවස්ථාපිත අයිතීන් උල්ලංඝනය කිරීමක් වශයෙන් සරත් විශ්වාස කරයි. තමාට සහ තම සගයන්ට ලබාගත හැකි ප්‍රතිකර්ම පිළිබඳව සරත් ඔබගේ උපදෙස් පතයි. ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 25)

06. නුරින් ජනරජයේ ජනාධිපතිවරිය වන, රැජිනා මාටින් 2019 ඔක්තෝම්බර් 15 වන දින නුරින් හි පාර්ලිමේන්තුව විසුරුවා හැරෙන බවට දක්වමින් 2019 ඔක්තෝබර් 14 වන දින ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. මෙම පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය 2017 මාර්තු 20 වන දින පවත්වන ලදී. සභාග ආණ්ඩුවේ අගමැතිවරිය වන මේගන් ප්‍රකාශ කර සිටින්නේ, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නීතිවිරෝධී බවත්, නුරින් හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත්, එවන් විසුරුවාහැරීමක් තහනම් කර ඇති ප්‍රකාශිත ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමක් බවයි. මේගන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, අමාත්‍යවරුන් පත්කිරීමේදී ඇයගෙන් උපදෙස් නොගත් බවත්, විධායකය විසින් අත්තනෝමතික තීරණයන් ගනිමින් සිටිනා බවත්ය.

කෙසේ වුවත්, රජිනාගේ මතය නම් පාර්ලිමේන්තුවෙ අත්‍යන්ත බහුතරයක් කිසිදු පක්ෂයකට නොමැති බැවින්, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ඇයට ප්‍රමාණවත් හේතුපැවති බවයි. ඇය තවදුරටත් ප්‍රකාශකර සිටින්නේ, මෛගන් පාර්ලිමේන්තුවේ සභය අහිමි කරගෙන ඇති බවයි. රජිනා ස්වකීය තීරණය යුක්ති සහගත බව පෙන්වීම පිණිස, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ' දේශපාලනික තීරණයක්' බවත්, නඩු දැමීමෙන් ඇයට විනිර්මුක්තියක් පවතින බවත් යන කරුණු දක්වා සිටියි.මෛගන් පාර්ලිමේන්තුව විසුරුවීමට ගත් ජනාධිපතිවරියගේ තීරණයෙහි නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක්කිරීමටත්, රජිනා ට එරෙහිව දෝෂාභියෝග ක්‍රියාවලියක් ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වේ.

නූරින් ජනරජයේ නීති පද්ධතිය, ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමානබව උපකල්පනය කරන්න. මෛගන්ට උපදෙස් දෙන්න. අවශ්‍ය තැන්හි දී අදාල ආණ්ඩුක්‍රමව්‍යවස්ථා ප්‍රතිපාදන, නඩු තීරණ අධිකාරීන් සහ ආණ්ඩුක්‍රමව්‍යවස්ථා මූලධර්මයන් ඇසුරින් ඔබගේ පිළිතුරු සනාථ කරන්න. (ලකුණු 25)

07. සේලා හී අග්‍රවිනිශ්චකාරවරිය වන කිම් මැතිණියට, 2015 දී සේලා හී නාගරික විශ්වවිද්‍යාලයේ ආණ්ඩුක්‍රමව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ දේශනයක් කිරීමට ආරාධනා ලැබිණි. එහිදී, ඇය සේලා හී ආණ්ඩුකරණයේ පවත්නා ප්‍රචලිත දූෂණය සහ වගවීමේ හි පවත්නා දුර්වලතා විවේචනයට ලක් කරන ලදී. පසුදින, ජාතික පුවත්පතක් වාර්තා කරනු ලැබූ යේ, සේලා හී ජනාධිපතිවරයා වන රෙන් මහතා විසින්, අගවිනිසුරුවරියගේ විවේචනයන් සම්බන්ධව ඔහුගේ අප්‍රසාදය පළකර ඇති බවයි. 2016 වසරේ මුල් භාගයේ දී, සේලා හී පාර්ලිමේන්තුව විසින් සැකකරුවන් වරෙන්තු නැතිව අත්අඩංගුවට ගෙන නඩු විභාග රහිතව මාස ගණනාවකට සිරගතකොට තබා ගැනීමට හැකියාව දෙන ආකාරයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

සිවිල් සංවිධානයක් විසින් මෙම පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කළ අවස්ථාවේදී, කිම් මැතිණිය විසින් මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවට අනනුකූල බව දක්වමින් අධිකරණයේ බහුතර තීන්දුව ලියා දක්වන ලදී. අධිකරණයේ විසම්මුතික තීරණය

ලියා දක්වන ලද්දේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ උපදෙස් නොලබා රෙන් මහතා විසින් සෘජුවම අධිකරණයට පත් කරන ලදැයි ජනතාව විසින් විවේචනය කරන ලද, අවී මහතා විසිනි. වසර 2017 දී, කිම් මැතිණිය ආණ්ඩු විරෝධී න්‍යාය පත්‍රයක වැඩ කරන බවට ආණ්ඩුව විසින් චෝදනා කළ අතර, ඇයගේ වැටුප් අඩු කර ඇයට එරෙහිව ද දෝෂාභියෝග ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. කිම් මැතිණියගේ ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශනය කිරීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලදී. 2018 වසරේ දී, තමා වෙනුවෙන් පෙනී සිටීමට කිම් මැතිණියට අවස්ථාවක් නොදී ම ඇයව ධුරයෙන් පහ කර, අවී මහතාව සේලා හි අග විනිසුරු ලෙස පත් කරන ලදී.

ඔබ විශ්වවිද්‍යාලයට අනුබද්ධ පර්යේෂකයෙක් බවත්, සේලා රාජ්‍යයෙහි අධිකරණ ස්වාධීනතාවය සහ පනත් පිළිබද අධිකරණ විමර්ශන බලය ගැන විශ්ලේෂණාත්මක ලේඛනයක් ලිවීමට ඔබට පවරා ඇති බවත් උපකල්පනය කරන්න. සේලා රාජ්‍යයේ සියළුම නීතීන් ශ්‍රී ලංකාවේ නීතින්ට සමාන බව උපකල්පනය කරමින් එම රචනාව ලියා දක්වන්න. (ලකුණු 25)

*******